# ඊශ්‍රායල් රාජ්‍ය සඳහා සාත්තුසේවක සේවිකාවන් බඳවාගැනීමේ ක්‍රියා පටිපාටිය

## ඊශ්‍රායලයේ ඉහළ වැටුප් සමඟ

## නිවාස පාදක සාත්තු සේවා රැකියා සඳහා බඳවාගැනීම.

**අවම වැටුප රු.325,000/-**

**සුදුසුකම් ලබාගන්න. ඉන්පසුව අයදුම් කරන්න**

**අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා අවසන් දිනයක් නොමැත.**

ඊශ්‍රායල් රජය (PIBA) සහ ශ්‍රී ලංකා රජය අතර ඇතිකරගත් ගිවිසුම (MOU) අනුව ඊශ්‍රායල් රාජ්‍ය සඳහා සාත්තු සේවක සේවිකාවන් කඩිනමින් බඳවා ගැනීම් සිදුකෙරේ.

ගිවිසුම් ප්‍රකාරව සුදුසුකම් සහිත අයදුම්කරුවන්ගේ තොරතුරු ඊශ්‍රායල් රජය විසින් හදුන්වා දී ඇති වෙබ් අඩවියට කාර්යාංශය විසින් ඇතුළත් කරනු ලැබේ. ඒ අනුව සාත්තු සේවා සුදුසුකම් සහිත අයදුම්කරුවන් සඳහා අයදුම්පත්‍ර කාර්යාංශ වෙබ් අඩවියේ පලකර ඇති වෙබ් පෝටාලය වෙත ඕනෑම අවස්ථාවක ඇතුළත් කිරීමට හැකිය. එබැවින් ඔබ කල යුත්තේ මෙහි පහත සඳහන් සුදුසුකම් සපුරා ගැනීමෙන් අනතුරුව අයදුම් කිරීමයි.

★ විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ දින 45 ඊශ්‍රායල් සාත්තු සේවා පාඨමාලාව හදාරා NVQ Level III සහතිකය ලබා ගැනීම.

හෝ

★ TVEC ආයතනයේ ලියාපදිංචිය ලබා ඇති ඕනෑම ආයතනයකින් සාත්තු සේවා පාඨමාලාව හදාරා NVQ Level III සහතිකය ලබා ගැනීම.

හෝ

★ හෙද හෝ සාත්තු සේවා වෘත්තියේ මාස 11 ක් හෝ ඊට වැඩි සේවා පළපුරුද්දක් තිබීම.

★ ඔබගේ සුදුසුකම් සහිත අයදුම් පත්‍රය මාර්ගගත ක්‍රමය ඔස්සේ www.slbfe.lk වෙබ් අඩවියට ඇතුළත් කළ යුතුය.

★ එම තොරතුරු මඟින් සාත්තු සේවා තනතුර සඳහා ඊශ්‍රායලය මගින් අයදුම්කරුවන් තෝරාගැනීම සිදු කරනු ලබයි. තෝරාගැනීම සිදු කරනු ලබන්නේ ඊශ්‍රායලය මඟින් ක්‍රියාත්මක ලොතරැයි ක්‍රමයක් මඟින් පමණි.

# ඊශ්‍රායල් රාජ්‍ය සඳහා සාත්තුසේවක සේවිකාවන් බඳවාගැනීමේ ක්‍රියා පටිපාටිය

**විශේෂ තොරතුරු -**

- ➢ අදාල සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගේ තොරතුරු ඊශ්‍රායල් වෙබ් අඩවියට යැවූ බවට අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයකින් දැනුම් දෙනු ලැබේ.
- ➢ ලොතරැයි ක්‍රමය මගින් තෝරාගත් අයදුම්කරුවන්ගේ තොරතුරු PIBA ආයතනය මගින් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට යොමු කල පසු, කාර්යාංශය අදාල අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මගින් දැනුම් දෙනු ලැබේ.
- ➢ ලොතරැයි ක්‍රමයෙන් තෝරාගනු ලබන අයදුම්කරුවන් වෛද්‍ය පරීක්ෂණය සඳහාත් පොලිස් වාර්තාව ලබා ගැනීම සඳහාත් කාර්යාංශය විසින් යොමු කරනු ලැබේ.
- ➢ ලොතරැයි ක්‍රමය මගින් සිදුකරන තේරීම අවසන් තේරීම නොවන අතර එය මූලික තෝරා ගැනීම පමණකි. ඉන් අනතුරුව පවත්වන සම්මුඛ පරීක්ෂණ සඳහාද පෙනී සිටිය යුතුය.
- ➢ වෛද්‍ය වාර්තා සහ පොලිස් වාර්තා ලබා ගැනීමේ අනුපිළිවෙළ මත සම්මුඛ පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරනු ලබන අතර ඉන් සමත් වන අයදුම්කරුවන් PIBA අයතනය සමඟ මාර්ගගත ක්‍රමය ඔස්සේ පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණය සඳහාද යොමුවිය යුතුය.
- ➢ ඉන් සමත්වන අයදුම්කරුවන් සඳහා සේවා ගිවිසුම PIBA ආයතනය මගින් කාර්යාංශය වෙත එවීමෙන් පසුව ඒ බව අයදුම්කරුවන් වෙත දන්වා ගිවිසුම් අත්සන් කරවීම කාර්යාංශය විසින් සිදු කරනු ලැබේ.
- ➢ ගිවිසුම් අත්සන් කිරීමෙන් අනතුරුව PIBA ආයතනය මගින් සිදු කරනු ලබන දැනුම් දීම අනුව රැකියාලාභීන් ඊශ්‍රායලය වෙත පිටත් කර හැරීම සිදු කරනු ලැබේ.

**අනෙකුත් සුදුසුකම් -**

- ★ වයස අවුරුදු 25-45 ත් අතර කාන්තාවක් වීම.
- ★ අ.පො.ස (සා.පෙළ) විභාගය සදහා පෙනී සිට තිබීම.
- ★ අවම උස 1.5ප හා අවම බර 45නට වීම.
- ★ මීට පෙර ඊශ්‍රායලයේ සේවය කර නොතිබීම.
- ★ ඉංග්‍රීසි භාෂා පාඨමාලාවක් හදාරා තිබීම. (ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ භාෂා පුහුණු පාඨමාලාවටද සම්බන්ධ විය හැක)
- ★ ඊශ්‍රායලයට රැකියාවක් සඳහා පිටත්වීමට දේශීය රැකියා නියෝජිත ආයතන වෙත අයදුම්පත් හෝ ගමන් බලපත්‍ර ලබා දී නොතිබීම.
- ★ ඉල්ලුම්කරුවන්ගේ ස්වාමිපුරුෂයන්/දෙමව්පියන් හෝ දරුවන් දැනට ඊශ්‍රායලයේ රැකියාවක නිරතව හෝ පදිංචිව නොසිටීම.
- ★ චෝදනා වලින් තොර පිරිසිදු පොලිස් වාර්ථා තිබීම.
- ★ ශාරීරික හා මානසිකව නිරෝගී විය යුතු අතර ක්ෂය රෝගය, සෙංගමාලය, ගොනෝරියාව, HIV ඒඩ්ස් යන රෝග ඇතුළු (නමුත් මේවාට පමණක් සීමා නොවූ) නිදන්ගත රෝග වලින් නොපෙලෙන ලොකු බරක් ඉසිලීමේ හැකියාව ඇති ඊශ්‍රායලයේදී අසීරු අන්දමේ සාත්තු සත්කාර කිරීමේ හැකියාව තිබිය යුතුය.

**බඳවාගැනීම ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙන් පමණි.**

## එතෙර සවියට මෙතෙර අත්වැල

**සභාපති - ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය**